# ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2021

## සභාපතිතුමාගේ පණිවිඩය

ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) 2021 සැමරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) සියලුම සාමාජිකයින් සමඟ ශ්‍රී ලංකාව එක්වන මෙම විශේෂ අවස්ථාවේ දී මෙම පණිවිඩය එවීමට ලැබීම බෙහෙවින් සතුටට කරුණකි. “අභියෝගාත්මක අවධියේ ඩිජිටල් පරිවතර්නය වේගවත් කිරීම” මැයෙන් වූ මෙම වසරේ තේමාව පිළිබඳව සිය දායකත්වය ලබා දීම මෙන්ම දැනුවත් කිරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සිය සියලුම සාමාජික රටවල් සමඟ ආරාධනා කෙරේ.

වතර්මානයේදී අන් කවරදාකටත් වඩා , ව්‍යාපාරවල ඩිජිටල් පරිවතර්නය මෙන්ම ඔවුන්ගේ පාශර්වකරුවන් සඳහා සේවාවන් ලබා දීමේ හවුල්කාරිත්වය, ඕනෑම ආයතනයක වධර්නය හා සාථර්කත්වය සඳහා අත්‍යවශ්‍ය වේ. අන්තජර්ාලයේ දෑ (Internet of Things), පස්වන පරම්පරාව (5G) , ක්ලවුඩ කම්පියුටින් ( Cloud Computing ),කෘතිම බුද්ධිය Artificial Intelligence (AI) වැනි නවීන තාක්‍ෂණයන් එදිනෙදා ජීවිතයේදී භාවිතා කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇදහිය නොහැකි තරම් වේගයෙන් සංවධර්නය වෙමින් පවතී. මෙම වෙනස්කම් ඩිජිටල් නවෝත්පාදනයන් සහ පරිශීලක ප්‍රජාවේ දිනෙන් දින ඉහළ යන අවශ්‍යතා අනුව මෙහෙයවනු ලැබේ. එබැවින් තිරසාර ආථර්ික වධර්නය සාක්ෂාත් කර ගැනීම සඳහා රටවල්, නගර, සංවිධාන සහ ප්‍රජාව මෙම තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ දියුණුව වැලඳ ගත යුතුය.

සිදුවන වේගවත් තාක්ෂණික වෙනස්කම් වලට අනුගත නොවී රටකට දියුණුවිය නොහැකි බව ප්‍රකාශවීමත් සමඟ ශ්‍රී ලංකා රජය විසින් වෙළඳ පහසුකම් සැපයීම, ඊ-රාජ්‍යය, ඊ-වාණිජ්‍යය, ගෝලීය තරඟකාරිත්වය, විවිධ කමර්ාන්ත සහ පාරිසරික ගැටළු යන අංශවල ඩිජිටල් පරිවතර්නය සඳහා උපාය මාගර් හා ක්‍රියාකාරී සැලසුම් ගෙනහැර දක්වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට පියවර ගෙන තිබේ.

COVID-19 වසංගතය ව්‍යාප්ත විමෙන් පසුව ඩිජිටල් පරිවතර්නය ද ශ්‍රී ලංකාවේ ප්‍රධාන මාතෘකාවක් වී තිබේ. මෙම දුෂ්කර කාලය තුළ, රටේ බොහෝ පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සංවිධානවලට ඔවුන්ගේ කායර්යන් ඉටු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපයෝගී කර ගනිමින් සිය ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීමට සිදු වී තිබුණි. දැන් ඩිජිටල් පරිණාමය අපගේ පෞද්ගලික හා වෘත්තීය ජීවිතයේ තීරණාත්මක අංගයක් බවට පත්වෙමින් තිබේ. මේ අනුව, ඩිජිටල් පරිවතර්නය කරා ගමන් කිරීම විශේෂයෙන් අභියෝගාත්මක අවධියේ තිරසාර ආථර්ික වධර්නය සහතික කළ හැකි එකම විකල්පය ලෙස අවධාරණය කර ඇත.

එමෙන්ම සියලුම පාශර්වකරුවන් සඳහා වඩා අථර්වත් වූ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයක් වේවායි ප්‍රාථර්නා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි.

ජයන්ත ද සිල්වා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති